# විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව

## ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්

(අ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් ඕනෑම විෂයයන් තුනක් එක් වතාවකදී සමත් වීම.

හෝ

(ආ) රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථිර සේවයේ වසර 03ක පළපුරුද්ද තිබීම සහ එකවර අ.පො.ස (උසස් පෙළ) පරීක්ෂණයෙන් විෂයයන් දෙකක් සමත් වීම.

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම.

හෝ

(ඈ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් මතු දැක්වෙන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

i. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් සමත් වී රජයේ පරිපාලන සේවයට ඇතුළත් වී සිටීම. (SLAS)

ii. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරීවරුන්ගේ සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් සමත්වී රජයේ ගණකාධිකරණ සේවයට ඇතුළත් වී සිටීම. (GAS)

iii. අධ්‍යාපන දෙපාර්තමේන්තු පුහුණු ගුරු සහතිකය ලබා තිබීම.

iv. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ දෑ අවුරුදු පාඨමාලාව සමත් වී තිබීම.

v. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දෑ අවුරුදු සහතිකය.

vi. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ ප්‍රථම සහ ද්විතීය වර්ෂ පරීක්ෂණ වලින් සමත් වී තිබීම.

vii. ලන්ඩන් වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

viii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයකින් ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

ix. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

x. ශ්‍රී ලංකාවේ හෝ එක්සත් රාජධානියේ ගණකාධිකරණ ශිල්පීය ආයතනය මඟින් පවත්වන විභාගයේ (AAT) සියලුම කොටස් සමත් වී තිබීම.

xi. ශ්‍රී ලංකා යුද්ධ, නාවික හෝ ගුවන් හමුදාවේ ස්ථිර බලකායක අධිකාරිලත් ශ්‍රේණියක නිලධාරියෙකු වීම.

xii. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තුමේන්තුවේ උප පොලිස් පරීක්ෂක හෝ ඊට ඉහළ නිලයක නිලධාරියෙකු වීම.

xiii. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

හෝ

(ඉ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි ඉහතින් නම් නොකරන ලද වෙනත් සුදුසුකම්.

බාහිර අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සෑම අයදුම්කරුවකුම/ අයදුම්කාරියක්ම එකී අධ්‍යයන වර්ෂයේ ජනවාරි මස 01 වන දින වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.